# සමූපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
## கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
## Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. } SP/CEC/1/O/5 | ඔබේ අංකය / உனது இல / Your No. } | දිනය / திகதி / Date } 2024.01.26 |

චක්‍රලේඛ අංක : 01/2024

දකුණු පළාතේ සියලුම සමූපකාර සමිතිවල සභාපතිවරුන් වෙත,

**<u>පිළිකා රෝගයට ප්‍රතිකාර ලබා ගැනීම වෙනුවෙන් වැටුප් සහිත විශේෂ නිවාඩු ලබාදීම.</u>**

පිළිකා රෝගය සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමේ දී දීර්ඝ කාලයක් ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවන බැවින් අදාල රෝගයට පත් වූ සේවකයින්ට නිවාඩු අනුමත කිරීමේ දී ගැටළු මතුවන බව සමිති විසින් විවිධ අවස්ථාවල කොමිෂන් සභාව දැනුවත් කර ඇත.ඒ අනුව එවැනි අවස්ථාවල සේවික/සේවිකාවන්ගේ අවශ්‍යතාවය පිළිබදව හා සමිතියේ කටයුතු පවත්වාගෙන යාම පිළිබදව සලකා සේවක /සේවිකාවන්ට සහන සැලසීම පිණිස මෙම පොදු උපදෙස් චක්‍ර ලේඛය නිකුත් කරන ලදී.

02. රජයේ හෝ ලියාපදිංචි පෞද්ගලික රෝහලක හෝ පිළිකා රෝගය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකුගේ වෛද්‍ය සහතිකයක් මඟින් නිවාඩු අවශ්‍යතාවය විධිමත් පරිදි තහවුරු කරනු ලබන අවස්ථාවක පිළිකා රෝගයට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා මාස 06කට නොවැඩි කාලයක් සම්පූර්ණ පඩි සහිත විශේෂ නිවාඩු ලබා දිය හැකිය.

03. එම මාස 06ක විශේෂ නිවාඩු අවසන් වූ පසු තවදුරටත් නිවාඩු අවශ්‍ය බවට පිළිකා රෝගය සඳහා විශේෂඥ වෛද්‍යවරයකු නිර්දේශ කරන්නේ නම් තවත් මාස 06ක කාලයක් සදහා අඩ වැටුප් සහිත නිවාඩු ලබා දිය හැකිය.

04. තවදුටත් එකී සේවකයාට නිවාඩු ලබා දිය යුතු බවට විශේෂඥ වෛද්‍යවරයකු නිර්දේශ කරන්නේ නම් 03 වගන්තිය යටතේ ලබා දුන් නිවාඩු අවසන් වූ පසු මාස 03කට නොවැඩි කාලයක් වැටුප් රහිත නිවාඩු ලබා දිය හැකිය.

4.1. එසේ වැටුප් රහිත නිවාඩු ලබා දීමේ දී අදාල සේවකයාගේ හා සමිතියේ යහපත ගැන සලකා බලා වැටුප් රහිතව තවදුරටත් නිවාඩු දීම යුක්ති සහගත ද, එසේ නැතහොත් අදාල සේවකයා සෞඛ්‍ය හේතු මත විශ්‍රාම ගැන්විය යුතුද යන්න පිළිබදව සුදුසු වෛද්‍ය මණ්ඩලයකට ඉදිරිපත් කර නිර්දේශ ලබා ගත යුතුය.

4.2. ඉහත 4.1හි නිර්දේශ ලබා ගත් පසු 5/2023 චක්‍ර ලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කල යුතුය.

05. මෙසේ අනුමත කරනු ලබන නිවාඩු සේවකයා/සේවිකාවගේ සාමාන්‍ය නිවාඩු වලින් අඩු නොකළ යුතුය.

06. මෙම චක්‍රලේඛ විධිවිධාන 2024.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ජයන්ත පී. ලියනගේ
ලේකම් (වැ.බ.)
සමූපකාර සේවක කොමිෂන් සභාව
දකුණු පළාත

ජයන්ත පී.ලියනගේ.
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත :-

| | | | |
|---|---|---|---|
| 01. | ලේකම් - කෘෂිකර්ම ගොවිජන සංවර්ධන....සමූපකාර අමාත්‍යාංශය (ද.ප) | - | දැ.ස. |
| 02. | සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (ද.ප) | - | දැ.ස. |
| 03. | දිවයිනේ සියලුම පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු | - | දැ.ස. |
| 04. | දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුව | - | දැ.ස. |